# එස්. එම්. මරික්කාර්
# S.M. Marikkar

පාර්ලිමේන්තු මන්ත්‍රී
Member of Parliament
කොලොන්නාව ප්‍රධාන සංවිධායක - සමගි ජන බලවේගය
**Chief Organizer Kolonnawa - Samagi Jana Balawegaya**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය My No. | M/KOL/038/22 | ඔබේ අංකය Your No. | | දිනය Date | 2022.06.30 |

මහාචාර්ය චරිත හේරත් මැතිතුමා,
සභාපති,
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ.

ගරු සභාපතිතුමනි,

<u>වැඩි මුදලට ලිට්‍රෝ සමාගම විසින් ගෑස් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ලබා ගැනීම</u>

ලිට්‍රෝ සමාගම විසින් ගෑස් මෙට්‍රික් ටොන් 280,000 ක් ලබා ගැනීම සඳහා කැඳවා තිබූ ටෙන්ඩරය අනුව, අඩුම ලංසුලාභී සමාගම විසින් මෙට්‍රික් ටොන් එකක් සඳහා CP + US$96 ක මුදලක් යෝජනා කොට තිබූ අතර අප්‍රේල් මාසයේදී ටෙන්ඩරය විවෘත කිරීමෙන් අනතුරුව මැයි මස 4 වන දිනැති ලිපියකින් ලිට්‍රෝ සමාගම විසින් අඩුම ලංසුලාභියාට එම ටෙන්ඩරය ප්‍රදානය කරන බව ලිඛිතව දන්වා තිබුණි. ඒ අනුව, ජූනි මස පළමුවැනි දින එම සමාගම සමඟ ගිවිසුම්ගත වීම සඳහා ගිවිසුම් කෙටුම්පතක් ද සකස්කොට තිබුණි. රට තුළ වර්තමානයේ පවතින ඩොලර් අර්බුදය හේතුවෙන් එම ගිවිසුම්ගත වීම සිදු නොවුණ අතර නැවත ගෑස් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ලබා ගැනීම සඳහා එම ටෙන්ඩරයේ අඩුම ලංසුලාභියාට ඉහළින් සිටින ලංසු තැබූ සමාගමට ලබා දීමට කටයුතු යෙදෙමින් පවතී. එය හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා මිලදී ගැනීමට කටයුතු කරන අතර, ඒ අනුව අඩුම ලංසුලාභියා හා සසඳන විට ඩොලර් 34ක් වැඩිපුර වියදම් කිරීමට සැරසේ. ඒ අනුව, ඩොලර් ලක්ෂ තිස් හතරක ( US$ 3,400,000) වංචාවක් හෝ නාස්තියක් සිදුවන බව පෙනී යයි.

එමනිසා, ඔබතුමා සමඟ දුරකථනයෙන් කථාකල පරිදි වහාම ලිට්‍රෝ සමාගම කැඳවා පරීක්ෂණයක් කරන ලෙස කෝප් කමිටු සාමාජිකයෙක් ලෙස මම ඉල්ලා සිටිමි. එමෙන්ම, මෙම ගණුදෙණුව සිදු වී අවසන් වූ පසුව විමර්ශණය කරනවාට වඩා ගණුදෙණුව සිදුවීමට පෙර විමර්ශණය සිදු කිරීම වඩාත් සුදුසු බව ද සඳහන් කරමි.

ස්තූතියි.
මෙයට විශ්වාසී,

එස්.එම්. මරික්කාර්
කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
81/A විජය පාර, සාලමුල්ල,
කොලොන්නාව.

එස්.එම්.මරික්කාර්
කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී


කාර්යාලය Office: නො. 81/A, විජය පාර, සාලමුල්ල, කොලොන්නාව. No. 81/A, Vijaya Road, Salamulla, Kolonnawa.
කාර්යාල දු. අං. Office Tel.No.: + 94 11 2572422, + 94 11 2533169
ජංගම දු. Mobile: +94 777886665
ෆැක්ස් අං. Fax No: +94 112533169
ඊ-මේල් E-mail: smmarikkar@gmail.com
ෆේස් බුක් Face book: S M Marikkar